## ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ව සංවර්ධන උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ව සංවර්ධන උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා පහත සුදුසුකම් සහිත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.10.29 දින වේ.

බඳවා ගන්නා ශ්‍රේණිය :- **සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය**

වැටුප් පරිමාණය (මාසික) :- **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 3 - 2016 වැටුප් කේත අංකය අනුව රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 – 57,550/-**

**02.** **බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

(අ) අයදුම්කරු /අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) සෑම අපේක්ෂකයෙකුම ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් සහ විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ඈ) ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

(ඉ) ඔවුන් වෙත පත්වීම් ලබාදීමෙන් අනතුරුව, තව දුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක්, අනෙකුත් පළාත් වලින් ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඊ) වයස : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**03.** **අධ්‍යාපන සුදුසුකම් :-**

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

හා

(ආ) ක්ෂේත්‍රයට අදාළව පහත සඳහන් විෂයන් දෙකක් සහිතව විද්‍යාව /ගණිතය/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත් වීම.( භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව හා කෘෂි විද්‍යාව)

**04.** **වෘත්තීය සුදුසුකම්**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු සත්ව පාලන ඩිප්ලෝමාව හෝ දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම

හෝ

(ආ) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ඇ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**05.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

(ආ) බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(ඇ) මෙම තනතුර සඳහා අනෙකුත් පළාත් වලින් බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ අවම වශයෙන් වසර 06ක් සේවය කළ යුතු වේ.

(ඈ) රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත් වූ නිලධාරියෙකු සේවය ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(ඉ) සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**06. බඳවා ගැනීමේ ක්‍රමය :-**

මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් විවෘත තරඟ විභාගයක් පවත්වා තරඟ විභාගයකින් අපේක්ෂකයන් ලබා ගන්නා ලකුණු වල ඉහළම ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, එසේ නොවන්නේ නම්, සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන්නේ නම් පමණි.

**07. අයදුම් කළ යුතු පිළිවෙල :-**

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවටද අංක 05 සිට 09 දක්වා තොරතුරු දෙවන පිටුවටද ඉතිරිය තෙවන පිටුවටද ඇතුළත් වන සේ ඉල්ලුම්පත්‍රය තමන් විසින්ම සකස් කර ගත යුතු අතර, ඒ ඒ ශීර්ෂයන් පහත උපදෙස් අනුව පැහැදිලිව **තම අත් අකුරින්ම** සම්පූර්ණ කළ යුතුය. **අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2020.10.29 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ඌව පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ **"ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ව සංවර්ධන උපදේශක තනතුරේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2020"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**08. අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු /නීතිඥවරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**09. විභාග ගාස්තු :-**

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා විභාග ගාස්තුව රු.900/- කි. මෙම මුදල ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ මහජන බැංකුවේ මුතියංගණ ශාඛාවේ ගිණුම් අංක 269-100-148-440-477 ට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන ලදුපතේ පිටපත අයදුම්පතට අලවා එවිය යුතුය. ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතික පරීක්ෂා කිරීමකින් තොරව තරඟ විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

**11.** විවෘත තරඟ විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ බදුල්ල නගරයේදී පමණි. තරඟ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**12.** විභාග දිනයේදී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

**13. තරඟ විභාගයේ විෂය නිර්දේශය:-**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ. රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයාගේ සුදුසුකම් හා හැකියාව පරික්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

බුද්ධි පරීක්ෂණය : මෙය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණ සංස්ලේෂණ හැකියාව,ඉක්මන් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ආදිය මැනීම සඳහා සකස් කළ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය: තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලෙන කෙටි හා ව්‍යුහගත ප්‍රශ්න පත්‍රයකි.

<u>සටහන :</u>
සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය. අපේක්ෂකයින් අතුරින් ලකුණු ලබා ගැනීමේ ඉහළම ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**14. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ සේවය පූර්ව දැනුම් දීමකින් තොරව අවසන් කරනු ලැබේ.

**15.** මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම /නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

ගාමිණී මහින්දපාල ජෝපියස්
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2020.09. 28 වන දින.
ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
බදුල්ල.